සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 21 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... **සිංහල භාෂාව හා සාහිත්‍යය I** කාලය පැය එකයි

I. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
II. 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණ වලින් නිවැරදිම හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

**අංක 1 සිට 3 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

(1) මාමාගේ බිරිය මාමාට **උරවක්‍රමාලාවකි**
1. ආභරණයකි 2. මහත් කරදරයකි
3. ඉටුදෙව්දුවකි 4. මෙහෙකාරියකි

(2) තම යහළුවා **ගිනිකන** මුදලාලි කෙනෙකු බවට පත්වූයේ කෙසේදැයි සමන්ට තවමත් ප්‍රශ්නයකි
1. දක්ෂ 2. උත්සාහවන්ත
3. අයුතු ලාභ ගන්නා 4. සාධාරණ

(3) ඔහු **ආවාටගියාට** වැඩ කරනවා දුටු ගුරුතුමිය ඔහුට අවවාද දුන්නා ය.
1. නොසැලකිල්ලෙන් 2. කැමැත්තෙන්
3. විවේකයක් නොගෙන 4. පැත්තකට වී

**අංක 4 සිට 6 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(4) ධර්මපාල තුමා පුද්ගල අභිවෘද්ධිය ඇති කර ගැනීම පිණිස බුදු දහමේ............................ලබාගත හැකි ආකාරයේ සූත්‍ර පාඨ උපුටා දක්වමින් සිංහලයන්ට පෙන්වා දුන්නේය.
1. අභිමතාර්ථය 2. අභිලාෂය
3. නිපුණත්වය 4. පිටිවහල

(5) වැස්සට අධිපති ඉන්ද්‍ර දෙවියන්ගේ ............................ලෙස රජතුමා නියඟයෙන් හා දුර්භික්ෂයෙන් රට ආරක්ෂා කරගෙන රාජ්‍ය විචාරය සිදු කරයි.
1. ප්‍රධානියා 2. නියෝජිතයා
3. සේවකයා 4. සහායකයා

(6) සාහිත්‍ය නිර්මාණයක සාර්ථක අසාර්ථක බව මැනිය හැක්කේ............................සිට එය විචාරය කිරීම මගිනි.
1. මධ්‍යස්ථව 2. ඒකපාක්ෂිකව
3. බුද්ධිමත්ව 4. සංවේදීව

(7) අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. ආදර්ශවත්, අභිවෘද්ධිය, අතිශයෝක්තිය, අපේක්ෂාව
2. පාරිශුද්ධ, පාලනය, පිළියෙල, පිළිවෙළ
3. නිරාකරණය, නිෂ්පාදනය, නිශ්ශබ්ද, නිදර්ශන
4. ජීවනෝපාය, ජනාධිපති ජාත්‍යන්ධ, ජනාදරය

(8) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. ප්‍රත්‍යයාර්ථ, විමර්ශන, ඓතිහාසික, වෛරය
2. කර්තෘ, සූර්ය්‍යා, අත්‍යවශ්‍ය, කනිෂ්ඨ
3. ඖෂධීය, දුෂ්පෝෂණ, රිද්මයානුකූල, නිෂ්ඵල
4. ස්වර්ණාභරණ, අතිශයෝක්ති, වීරෝධාර, පර්යේෂණ

(9) අනුස්වාරය, දීර්ඝ පාපිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
1. මූලාරම්භය, අංකය, කාලය, වැල
2. සංගමය, මිහිරි, රූල, දැල
3. ගංගාව, කුර, පෑන, තාරාවා
4. මංගල, රූපය, රැය, සාමා

(10) පහත වචන අතරින් තත්භව වචනයකට උදාහරණයක් වන පිළිතුර තෝරන්න.
1. ශ්වේත 2. පළමු
3. බ්‍රාහ්මණ 4. ව්‍යාඝ්‍ර

(11) මහලු නිවාසයේ දානමය කටයුත්තක් සඳහා බොහෝ දෙනෙක් එක්වූහ. මෙහි "මහලු" යන්න
1. උපසර්ගයකි 2. නාම ප්‍රකෘතියකි
3. නිපාතයකි 4. තද්ධිතයකි

(12) සිසිවන වුවන ඉඟ සුග ගතහැකි මිටින
නිසි පුළුලුකුල රිය සකයුරු තිසර තන
ඉහත පද්‍ය කොටසේ කැටිකළ අදහසින් ප්‍රකාශ වන අලංකාරය කුමක්ද?
1. ස්වභාවෝක්තිය 2. රූපක
3. අතිශයෝක්තිය 4. උපමා

(13) "ගනිති" යන ක්‍රියා පදයේ මධ්‍යම පුරුෂ අතීතකාල ඒකවචන ක්‍රියාපදය වන්නේ
1. ගත්තෙහු 2. ගත්තෙහි
3. ගන්නෙහි 4. ගනියි

**අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.**

(14) **පාදප** ශ්‍රේණිවලින් සැදුම්ලත් සිංහරාජය අලංකෘත වනයකි.
1. ගංගා 2. දියඇලි
3. වෘක්ෂ 4. කුරුළු

(15) සොරුන් **කෝච්චකට** බැසයනු දුටු රාජ පුරුෂයෝ ඔහු ලුහුබඳනට වූහ.
1. කැලයකට 2. වැවට
3. තැනිතලාවකට 4. කුඩාවීදියකට

(16) ඔහු පොත්පත් **පරිශීලනයෙන්** දැනුම ලත් අයෙකි.
1. කියවීමෙන් 2. හැදෑරීමෙන්
3. ලිවීමෙන් 4. පරිත්‍යාගයෙන්

(17) පහත සඳහන් පද අයත් වන ව්‍යාකරණ ප්‍රවර්ගය තෝරන්න.
ප්‍රබල, සුපිරිසිදු, සුදන
1. නිපාත 2. රූඩී
3. උපසර්ග 4. විශේෂණ

(18) එක් එක් පද පේළියේ උක්ත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1. කුමාරයෙක්, ළමයා, කාන්තාවක්, හාවෙකු
2. දැරියක්, නුඹලා, ක්‍රීඩකයෝ, කුරුල්ලා
3. මැණියන්, නිර්මාණකරුවෙක්, සතුරෝ, වෘක්ෂලතාවෝ
4. කතුවරයා, සේවිකාවක්, ගොවියන්, පාලකයෝ

(19) එක් එක් පද පේළිවල, දී ඇති පද යුගලවල සාමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.
1. ළෙහි - පපුවෙහි, සියලඟ - මුළුඇඟ, මාගම - ස්ත්‍රිය, තෙදින් - තේජසින්
2. අනූන - අඩුනැති, හරිත වර්ණ - කොළ පැහැය, පියුම් - උපුල්, උචිත - යෝග්‍ය
3. සතුට - සොම්නස, ලෝකය - දියත, මිත්‍රයා - සකි, ශක්‍රයා - සහසැස්
4. විලිකුන් - ඉදුණු, නෑසියන් - බන්ධූන්, අස්වන් - අස්වැන්න, සරණ - පිහිට

(20) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ මින් කුමක්ද?
1. උත්සාහය - නිරුත්සාහය 2. පාපිෂ්ඨ - ධර්මිෂ්ඨ
3. බහුල - දුබල 4. දුක් - නිදුක්

(21) පහත පිළිතුරු අතුරින් යුගල පදයක් නොවන වරණය තෝරන්න.
1. අස් පස් 2. කන පාලු
3. අරුම පුදුම 4. තුටු පහටු

(22) පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න
1. සංචාරකයා සීගිරිය නරඹා වාර්තාවක් සකසයි.
2. නිලධාරීහු කරුණු දක්වමින් අදහස් දක්වති.
3. මව දරුවා ලවා පොත් මේසය සකසවයි.
4. ඈ නට නටා ගී ගයයි.

(23) නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ව්‍යඤ්ජන අක්ෂරයකට "අ" ස්වරය එකතු වූ විට හල් ලකුණ යෙදේ.
2. "සතුරෝ පහර දෙති''යි පාලකයෝ බියවූහ" යන්න නිවැරදි වාක්‍යයකි.
3. "කියවද්දී" යන්න අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවකි.
4. ඓ, ඖ යන අක්ෂර සංයුක්ත අක්ෂරයි.

(24) ස්වර සන්ධියට උදාහරණයක් නොවන වරණය තෝරන්න.
1. දකුණත　　2. ඔවුනොවුන්
3. රුවනාර　　4. නිලුපුල්

(25) ඌෂ්මාක්ෂරයක් සහිත පදයක් ඇතුළත් නැති වරණය තෝරන්න.
1. විශාල, අහස්ගැබ　　2. පෝෂිත, බහුශ්‍රැත
3. සිනහව, උදාරතම　　4. ද්වීභාෂා, ශිෂ්‍ය

**අංක 26 - 27 දක්වා දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න**

(26) එක කරදරයක් පිට තවත් කරදරයක් ඇතිවීම
1. උඩින් මිතුරු යටින් කතුරු
2. එකා යකා කීවලු
3. කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ
4. අලි මදිවට හරක්

(27) තමා වැරදි කරමින් අනුගාමිකයින්ට නිවැරදි මඟ පෙන්වීම
1. හැට පැන්නත් වඳුරා බිම ගමන් යන්නේ නැතිලු
2. කකුළුවා පැටවුන්ට කෙළින් යන්න කීවා වගේ
3. ජම්මෙට වඩා පුරුද්ද ලොකුයි
4. උපන්ගේ ගතිය බලි ඇරියත් ඇරෙන්නේ නැතිලු

(28) මුලින් දී ඇති පදයේ අර්ථය වැරදි ලෙස දී ඇති වරණය තෝරන්න.
1. පතල - ප්‍රසිද්ධ　　2. සග - ස්වර්ග
3. නිදාන - හේතු　　3. නුවන - ඇස

**අංක 29 - 30 තෙක් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(29) 1. ඈ නිළියක් සේ සැරසුණාය.
2. බාලිකාවෝ ගුරුභවතුන් සමඟ ගමන් ගත්හ.
3. ව්‍යාපාරිකයෝ ද අමාත්‍යවරයා ද සාකච්ඡා කළේය.
4. මම සීගිරිය නරඹා නැත.

(30) 1. රියදුරන් විසින් සැලකිල්ලෙන් බස්රථ ධාවනය කරන ලදහ.
2. පිතිකරුවෝ උපදෙස්වලට සවන් දී නැත.
3. දරුවෝ අමුත්තන් දැක සතුටු වෙති.
4. සුළඟින් හා වර්ෂාවෙන් නිවාස විනාශ වෙති.

(31) A - ඉරිදා නිවාඩු දිනයක් ................................... ඇතැම් වෙළෙඳසැල් විවෘතව ඇත.
B - සභාපති තුමා මුලසුනේ කථාව කළ ............................... ලේකම්තුමිය ස්තුති කථාව කළාය.
C - ගමෙහි බක්මහ උළෙලක් පැවැත්වෙන...................... තරුණයෝ උත්සව භූමිය පවිත්‍ර කරති.

**ඉහත වාක්‍යවල හිස්තැන් සඳහා සුදුසු නිපාත පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.**
1. වුවත්, බව, අතර
2. වුවත්, අතර, නිසා
3. වුවද, සඳහා, අතර
4. නමුත්, නිසා, පිණිස

(32) පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක්ද?
"ඔවුන් පැමිණෙන විට පාසල් සිසුන් පෙළගැසී සිටියා"
1. ඔවුන් පැමිණෙද්දී සිසුන් පෙළගැසී සිටියහ.
2. ඔවුහු පැමිණෙද්දී සිසුන් පෙළගැසී සිටියහ.
3. ඔවුහු පැමිණෙද්දී සිසුහු පෙළගැසී සිටියහ.
4. ඔවුන් පැමිණෙද්දී සිසුහු පෙළගැසී සිටියහ.

(33) ප්‍රබුද්ධ, සක්වාලිහිණි යන ග්‍රන්ථ වල රචකයා නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. විමල් දිසානයක　　2. සාගර පලන්සූරිය
3. මහගමසේකර　　4. සිරි ගුණසිංහ

(34) උපමාවක් සහිත පද්‍ය පේළිය දැක්වෙන වරණය කුමක්ද?
1. රුරුසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
2. වතින් සොමි සඳවූ
3. සාරපලය අඹදඹ රඹ ද වල්පිට
4. සඳවා සුදු වැලි පිවිතුරු

(35) "යුගාන්ත වාතයෙන් නැමීයන <u>අඳුන් කුළක්</u> සේ බුදුන් පාමුල්හී වැඳ වැතිර ගියේ''
මෙහි "අඳුන් කුලක්" යන්නෙහි අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

1. කන්දක්
2. උස කණුවක්
3. කළුපාට පර්වතයක්
4. වැහිවළාවක්

(36) පහත පද්‍යයෙහි හතරවැනි පදය සම්පූර්ණ කරන්න.

අහසේ අඳුරු පැහැ වැහි කළු නගින කොට
සුළඟේ වෙනස මෙහි ගහකොළ කියන කොට
ගෙරවිලි සහිත විදුලිය හඬ ඇසෙන කොට
..................................................................................

1. මා නොදැනුවත්වම මම මගෙ දෙපය පිට
2. හිමි ඇත වෙහෙසෙමින් වෙහෙසී ඇති දුරට
3. සිහියට නැගෙනු ඇත මා මෙහි නිදන විට
4. හිමියනි මගේ හිත වාවනු බැරිය මට

(37) "තා කෙරෙහි මා සැක ඇත්තෙමි. එබැවින් මම අතු අගින් අගට පැන ගොස් තට මඟ පාමින් යෙමි" මෙම ප්‍රකාශය ඇතුළත් කතා පුවත දැක්වෙන වරණය තෝරන්න.

1. රාජාවලිය
2. මහාකපි ජාතකය
3. බුත්සරණ
4. සද්ධර්මරත්නාවලිය

(38) "පසුගිය නත්තල් කාලේ නිවාඩුවෙයි මං ආවේ
පුංචි බේබි එක්කල පාසල් යන්නයි මං ආවේ"
මෙම පද්‍ය රචනා කළේ

1. චන්ද්‍රරත්න මානවසිංහය
2. මොනිකා රුවන් පතිරණය
3. රපියල් තෙන්නකෝන්ය
4. කුමාරතුංග මුනිදාසය

(39) උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරියහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ
මෙම පද්‍ය තුළින් දැක්වෙන්නේ,

1. සැඳෑ වැනුමකි
2. උදා වැනුමකි
3. වන වැනුමකි
4. සැණකෙළි වැනුමකි

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
"දැනට අප හමුවේ ඇති තොරතුරු අනුව මෙරටෙහි ලියැවුණු, අපට හමුවන ලේඛන ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසට අයත්යැයි පිළිගැනේ"

1. මෙරට ලේඛන කලාව දිව යන්නේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස දක්වා දීර්ඝ ඉතිහාසයකට පමණකි.
2. ලේඛන කලාව පිළිබඳ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස තරම් ඉතිහාසයකට පිළිගත හැකි තොරතුරු මෙරට හමු වී නැති තරමය.
3. මෙරට ලේඛන කලාව පිළිබඳ ඉතිහාසගත කරුණුවලට අනුව ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස දක්වා දීර්ඝ ඉතිහාසයක් ඇති බව දැනට හමුවූ තොරතුරු අනුව පිළිගැනේ.
4. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසට පසු මෙරට ලේඛන කලාව පිළිබඳව පිළිගත හැකි තොරතුරු අපට හමු වී ඇත.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# Provincial Department of Education - NWP

| 21 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

**විභාග අංකය ....................................** **සිංහල භාෂාව හා සාහිත්‍යය II** **කාලය පැය දෙකයි**

**I සිට X තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) i සිට x තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල හෝඩියේ ඇති
(අ) අන්තඃස්ථ අක්ෂරයක් (ආ) නාසික්‍ය අක්ෂරයක් ලියන්න

ii. පහත සඳහන් කවියේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
කන්කළු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන්රසු දැල් කොළහල වන බියෙනේ

iii. පහත සඳහන් පද විසන්ධි කරන්න.
(අ) දැත (ආ) පොත්තල්මාරිය

iv. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා ලියන්න.
සිතාරි විසින් සිය ගුරුතුමිය ලබාදුන් උපනායිකා තනතුර පිළිගනු ලැබිණි.

v. පහත සඳහන් පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
"**එතෙපුල්** අමාහැල්ලෙන් **කෝ** ගිනි කඳ නිවී ගියා"

vi. පහත සඳහන් අදහස් වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
(අ) ඉතා වේගයෙන් ධාවනය කරන
(ආ) කැලයේ ඉබේටම හටගත් ගින්න

vii. පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.
(අ) කඩච්චා (ආ) ඔයනවා

viii. පහත වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.
(අ) නාවිකයෝ වෙරළ කරා පැමිණ නැත
(ආ) මව හෝ පියා රැස්වීමට සහභාගී වන්නීය.

ix. පහත පදවල ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) කඩවයි (ආ) ගයමින්

x. පහත වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
(අ) ඔවුහු අප කැඳවූහ.
(ආ) පරිසර අමාත්‍යාංශය වන ජීවින්ගේ පැවැත්ම උදෙසා නව වැඩපිළිවෙළක් සකස් කරයි.

**(එක් අනුකොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20යි)**

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) කාර්යබහුල ජීවන රටාව තුළ ශරීර සෞඛ්‍යය නිසි පරිදි පවත්වා ගැනීම පිළිබඳ ව නූතන මිනිසා දක්වන්නේ අඩු අවධානයකි. ක්ෂණික ආහාර හා කෘත්‍රිම ආහාර භාවිතයත්, නිසි පරිදි ව්‍යායාම නොලැබීමත් ආදී හේතු නිසා ඔවුහු විවිධ රෝගී තත්ත්වයනට බඳුන් වෙති. නිරෝගි අනාගත පරපුරක් තැනීම උදෙසා ඉතා ඉක්මනින් මේ තත්ත්වය වෙනස් කළ යුතුව ඇත.

(ආ) අතීත සිංහලයා සතුව තිබුණේ අන්‍යෝන්‍ය සාමූහිකත්වය මත ගොඩනැගුණු ජීවන රටාවකි. නවීන තාක්ෂණික මෙවලම් භාවිතය නිසා එම සාමූහික ජීවන රටාව බිඳ වැටී තම තමන්ගේ ලෝකවල හුදෙකලා වූ යාන්ත්‍රික සමාජයක් බිහි ව තිබේ. මෙය සාම්ප්‍රදායික හෙළ සංස්කෘතියට වැදුණු පහරකි. මේ තත්ත්වය තුළ මානව සබඳතා බිඳවැටීම වළක්වාලිය යුතුය.

(ඇ) අතීතයේදී ස්වාභාවික ආපදා තත්ත්වයන්ගෙන් මිදීමට මිනිසා දෙවිදේවතාවුන්ගේ පිහිට පැතුවේය. වර්තමානයෙහි, විවිධ ආපදා තත්ත්වයන් නිර්මාණය කිරීමෙහි කොටස්කරුවන් බවට මිනිසා පත්ව සිටියි. වසර කීපයකට පෙර සුනාමි තත්ත්වයකට මුහුණ දුන් ලාංකිකයෝ වරින් වර නියඟ, ගංවතුර, නායයෑම්, සුළිසුළං ආදියට මුහුණ දෙමින් සිටිති. එබැවින් ආපදා කළමනාකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබ සිටීම අත්‍යවශ්‍ය කරුණකි.

(ඈ) ඉහළ අහසේ වලාකුළු අතරෙහි සැඟව ගිය ගුවන් යානය සිතින් මවා ගන්නට මම තැත් කළෙමි. අවසන් මොහොතේ ඇගේ දෙනෙතින් ගැලූ කඳුළු ද ඇගේ තුරුලෙහි මා සිරකොට ගෙන සිටි අයුරු ද මට සිහි වෙයි. "අම්මේ" යයි කියා මුළු ලොවට ම ඇසෙන සේ කෑගසන්නට මට සිතෙයි.

(ලකුණු 25යි)

(03) පහත දැක්වෙන පාඨය වචන 55 - 65 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

" අප කැමති වුවත් නැතත් වර්තමානයේ අප හුරුවෙමින් සිටින්නේ, තාක්ෂණික සමාජයකට පිවිසෙන්නටය. සාමාජික සංස්ථා මෙන් ම තාක්ෂණය ද නවීකරණය හා අභිවර්ධනයට ද භාජන වන්නේය. මෙම විපර්යාසයන්ගෙන් මුද්‍රණ ශිල්පය හා සම්බන්ධව සිදුවන වෙනස්වීම්වලින් නවකතාවට ද ගැලවිය නොහැකි ය. ඉලෙක්ට්‍රොනික ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි ඇති වන වෙනස්කම් ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවින්ද වැඩිය. මේ හේතුව නිසා දෘශ්‍ය සාහිත්‍යාංගයන්හි ඇති වන වෙනස සිතා ගත නොහැකි තරම් ය. කවුරු මොනවා කීවත් විභාග සඳහා නියමිත හෝ ඒ හා අදාළ අවස්ථාවක හැර පාඨකයන් නවකතා කියවන්නේ ඔවුන්ගේ විවේකය අර්ථවත් ආකාරයකට විනෝදයෙන් ගත කරන්නටය. ඉලෙක්ට්‍රෝනික ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්ගේ අභිවර්ධනය හා ව්‍යාප්තිය නිසා නවකතාවක් කියැවීමෙන් ලැබූ ආස්වාදයට වඩා පහසු ආස්වාදයක් ලැබීමට අවිවේකී ජනතාව පෙළඹීම ස්වභාවිකය. මෙහි දී ආර්ථික සාධකයද බෙහෙවින් වැදගත් වන්නේ ය. නිදසුනක් හැටියට චිත්‍රපටියක් හෝ ටෙලිනාට්‍යයක් නැරඹීම විවේකය විනෝදයෙන් ගත කිරීමට නවකතාවක් කියවීමට වඩා ලාභදායක වුවක් මෙන්ම එහි දී සාක්ෂරතාව ද අවශ්‍ය වන්නේ නොවේ. මෙම තත්ත්වය යටතේ පාඨකයා අනාගත නවකතාව කෙරෙහි රඳවා ගැනීමට නම් නවකතාව වඩා ප්‍රබල මාධ්‍යයක් බවට පත්විය යුතුය. මෙහි දී අපගේ අවධානය යොමු විය යුතු තව ද එක් කරුණක් ඇත. එනම් නවකතාව යන්නෙන් අප වටහාගෙන ඇති සාහිත්‍යාංගය, ඊයේ අප සිතූ අයුරින් ම හෙට ද පිළිගත යුතු ද යන්න ය."

(ලකුණු 10යි)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

" සම්භාව්‍ය සිංහල නිර්මාණ සාහිත්‍යයට අයත් ගී කාව්‍ය තුනකි. ඒවා නම් මුවදෙව්දාවත, සසදාවත හා කව්සිළුමිණය. මේවා ලියවෙන්නට ඇත්තේ ද ඉහත සඳහන් අනුපිළිවෙළට ම ය යනු සාමාන්‍ය පිළිගැනීමයි. ඒ එසේ නම් කාලයත් සමඟ කාව්‍යය ප්‍රවර්ධනය වී ගිය බව මේ කෘති සංසන්දනාත්මකව අධ්‍යයනය කරන විට පෙනී යයි. වෙනත් වචන වලින් කියතොත් මුවදෙව්දාවතට වැඩි දියුණුවක් සසදාවතෙහිත්, ඒ දෙකටම වැඩි දියුණුවක් කව්සිළුමිණෙහිත් දක්නට ලැබේ. මුවදෙව්දාවත හා සසදාවත ඛණ්ඩ කාව්‍යයන් වන අතර කව්සිළුමිණ සංස්කෘත විචාරකයන් විසින් දක්වා ඇති මහා කාව්‍ය ගණයට අයත් වේ. සිංහල කවිය කෙසේ ප්‍රභවය ලද්දේ දැයි කීමට අද අපි නොදනිමු. දැනට විද්‍යාමාන ආදී පද්‍ය ග්‍රන්ථ දෙස බැලූ මතින් නම් කෙනෙකුට හැඟී යනුයේ ඒවා සංස්කෘත කාව්‍යයන් ආශ්‍රයෙන් පහළ වන්නට ඇත යනුයි. ආදිම පද්‍ය ග්‍රන්ථය වූ සියබස්ලකර සංස්කෘත අලංකාර ග්‍රන්ථයක පරිවර්තනයකි. ඉහත කී නිර්මාණ ග්‍රන්ථ ත්‍රයෙහි ද සංස්කෘත ආශ්‍රයෙන් පැමිණි අලංකාර, උපමා, රූපක පමණක් නොව හින්දු දේව සංකල්ප ද වෙයි. මුල් යුගයට අයත් එකම ඡන්දස් ග්‍රන්ථය වූ එළු සඳැස් ලකුණෙන් වුව ද පෙනී යනුයේ එය සංස්කෘත ඡන්දස් ග්‍රන්ථ අනුව රචිත බවකි.

i. සංස්කෘත අලංකාර ග්‍රන්ථයක පරිවර්තනයක් ලෙස මෙහි දක්වා ඇති කෘතිය කුමක් ද?
ii. මෙහි දක්වා ඇති මහා කාව්‍යය කුමක්ද?
iii. සම්භාව්‍ය සිංහල නිර්මාණ සාහිත්‍යයට අයත් ගී කාව්‍ය තුන නම් කරන්න.
iv. එකී ගී කාව්‍ය කෘති සැසඳීම තුළින් පෙනී යන කරුණ කුමක්ද?
v. පහත පදවලට සමාන පදය බැගින් ඡේදයෙන් සොයා ලියන්න
(අ) සඳැස් (ආ) සකු

(ලකුණු 10යි)

(05) සාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පවුල් 50ක් පමණ ජීවත් වන ''හේනේගම'' ගම්මානයෙහි මිනිසුන් බොහෝ පිරිසක් තවමත් සෞඛ්‍යාරක්ෂිත වැසිකිළි භාවිතය කෙරෙහි යොමු වී නැත. ඒ තුළින් විවිධ රෝග පැතිරී යාම, පරිසරය අපවිත්‍ර වීම ආදී ගැටලු ඇතිව තිබේ. මේ තත්ත්වයන් ගම්වාසීන් වෙත පහදා දී ඔවුන් නිසි සනීපාරක්ෂක පහසුකම් භාවිත කිරීම කෙරෙහි යොමු කරවීම සඳහා සුදුසු නිලධාරියෙකුගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් තුමා වෙත යැවීමට සුදුසු රාජකාරි ලිපියක් ලියන්න. ඔබ අදාළ ගමෙහි "ප්‍රගති" ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් එච්. ඒ. කුමාරසිරි ලෙස සලකන්න.

නැතහොත්

දළදාපුර මහා විද්‍යාලයෙහි වාර්ෂික සාහිත්‍ය උත්සවය ලබන මස 14 වන දින විද්‍යාලයීය රැස්වීම් ශාලාවේ දී පැවැත්වීමට නියමිතය. සංස්කෘතික අංග රැසක් ඇතුළත් මේ අවස්ථාවට කලාකරුවන් හා විද්වතුන් විශාල පිරිසක් සහභාගීවීමට නියමිතය. මෙම උත්සවය සංවිධානය කෙරෙන්නේ විද්‍යාලයීය සාහිත්‍ය සංගමය මගිනි. එහි ලේකම් දිනිඳු ජයසිංහ ඔබ යයි සිතා මෙම උත්සවයට අදාළ න්‍යාය පත්‍රය පිළියෙල කරන්න.

(ලකුණු 15යි)

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 21 | S | III |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... **සිංහල භාෂාව හා සාහිත්‍යය III** කාලය පැය දෙකයි

**උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**
**1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
**මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80කි.**

(01) i සිට x තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "සාල් නැළිය හෝ බත්මුල ගනුව" යි කීය.
(අ) මෙම කොටස ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය ලියවූ යුගය කුමක් ද?

ii. පියසන් නොව බිඟුදැල් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදටම කුහුලී
ඉහත කවියේ ඉදිරි පද දෙක ලියන්න.

(අ) ..........................................................................................................................................

(ආ) ..........................................................................................................................................

iii. "ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන් බියෙන් ඇළලී යන විට ඇගේ තනිකම ඈට දැනුනේ වඩාත් බලවත් ලෙසිනි".
(අ) මෙම කොටස ඇතුළත් කෘතිය කුමක්ද?
(ආ) එම කෘතිය සිංහලයට පරිවර්තනය කළ පරිවර්තකයා නම් කරන්න.

iv. මිතුරු කමින් පෙරට එතොත්
දූවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්
(අ) ඉහත පද්‍ය ඇතුළත් පද්‍ය පන්තිය නම් කරන්න.
(ආ) එම පද්‍ය පන්තිය රචනා කළ රචකයාගේ මුල්ම කාව්‍ය කෘතිය කුමක්ද?

v. "හෙ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ, දර පලා සඳහා වල් යන්නාහු නැති"
(අ) මෙම කොටස ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියෙහි කතුවරයා නම් කරන්න.

vi. (අ) "සද්ධර්ම රත්නාවලිය" කෘතිය ලියවූ යුගය කුමක්ද?
(ආ) "සද්ධර්ම රත්නාවලිය" කෘතිය ඇසුරින් ඔබට නියමිත පාඩම කුමක්ද?

vii. (අ) එච්. එම්. කුඩලිගම කවියාගේ අන්වර්ථ නාමය කුමක්ද?
(ආ) එච්. එම්.කුඩලිගම මහතා අයත් වන සාහිත්‍ය අවධිය නම් කරන්න.

viii.(අ) සිංහබාහු නාට්‍ය සඳහා පාදක කරගත් තේමාත්මක කතා පුවත කුමක්ද?
(ආ) එම කතා පුවත ඇතුළත් කෘතිය කුමක්ද?

ix. (අ) ගුත්තිල කාව්‍ය රචනා වූ යුගය කුමක්ද?
(ආ) ගුත්තිල කාව්‍ය සඳහා පාදක කරගත් ජාතක කතාව කුමක්ද?

x. පහත සඳහන් කෘතීන්හි කතුවරු නම් කරන්න.
(අ) මළ ගිය ඇත්තෝ
(ආ) පාළිධම්ම පදට්ඨ කතාව

(02) පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. " ආචර්යයා අඹුව සහ සසඟ ඇත්තේ යැයි බිඳූපියම්'හ යි බැණැ ගෙනැ තුන් රැසක් වැ පළමු ඇතැම් කෙනෙක් ආචර්යයා කරා එළැබැ වැඳැ සිටියාහ"
(අ) අංකිත පද වල අරුත් ලියන්න
(ආ) ඉහත කොටසෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න

ii. "තොප නිසා විද්දත් වූවා මඳින් නපුරුත් ඇසුව මනාද? පලායෙමි."
(අ) මෙසේ පලා යාමට සූදානම් වන්නේ කවුරුන්ද?
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කුමක්ද?

iii. "දේවයන් වහන්ස නොසිතා වදාළ මැනව, අනෙක් බලවත් උපායෙක් ඇති."
(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද? කාහටද?
(ආ) මෙම බලවත් උපාය කුමක්ද?

iv. කඳු බැවුමක දං බෝවිටි පඳුරු තලා
පහළට ඇඳී පරමල් පෙති ඉවත නොළා
කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා
සංගීතවත් වී යම් ඉදිරියට ගලා
(අ) අංකිත පදවල අරුත් ලියන්න
(ආ) මුළු කවියේම අර්ථය ලියන්න.

v. ඇයිද පියාණන් සමඟා
ලෙනෙහි වෙසෙන්නේ
හැර දමා එ රාජ ඉසුරු
උවදුරු අතරේ
(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන්ද?
(ආ) මෙසේ පවසන අවස්ථාව කුමක්ද?

(03) i. ක්‍රියාශීලි ඇවතුම් පැවතුම්වලින් යුක්ත වීම,
ii. ගුරු වචනයට ගරුකර ශිල්පයට උපචාර දැක්වීම,
අහිංසකගේ එකම අපේක්ෂාවයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

ගුත්තිල මූසිල වීණා නාදයේ,
i. ගුත්තිල ඇඳුරුතුමාගේ විශිෂ්ට ජයග්‍රහණයත්,
ii. මූසිල අන්දමන්දව අසරණව සිටි ආකාරයත්,
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(4) i. දරුවන් තුළ ජාතිකාභිමානය වඩාවාලීමත්,
ii. යුතුකම් හා වගකීම් අවධාරණය කිරීමත්,

ජාතික තොටිල්ල පද්‍ය පන්තියෙන් පෙන්වා දී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් මෙය පැහැදිලි කරන්න.

නැතහොත්,

i. උචිත කාව්‍යෝපක්‍රම භාවිතයත්,
ii. අපූරු ජීවන දර්ශනයත්,
නිසා ගංගාවේ සංගීතය පද්‍ය පංතියේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

(05) " උග්ගසේන කතා වස්තුව තුළින් උග්ගසේන ජීවිතයේ අභියෝග ජයගත් අයෙක් බව පැහැදිලිය" මෙම කියමන නිදසුන් තුනක් දක්වමින් සනාථ කරන්න.

(06) "ජනකවියා ලොකු කුඩා සියලු දෙනාට යහපත් ජීවිතයක් උදෙසා අවවාද උපදෙස් දෙන්නට සමත් වී ඇත." මෙය ඔබට නියමිත පාඩම ඇසුරින් නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(07) බැද්දේගමත්, එහි ගම් වැසියනුත් ක්‍රමයෙන් අභාවයට යන ආකාරය අපූරු ආකාරයට නිරූපණය කිරීමට කතුවරයා දැක්වූ කුසලතාවය නිදසුන් තුනක් දක්වමින් සාකච්ඡා කරන්න.

පළමු වාර පරීක්ෂණය - 2018
සිංහල භාෂාව හා සාහිත්‍යය - 11- ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 2 | 21 | 2 | 31 | 2 |
| 2 | 3 | 12 | 3 | 22 | 1 | 32 | 4 |
| 3 | 1 | 13 | 2 | 23 | 4 | 33 | 3 |
| 4 | 4 | 14 | 3 | 24 | 1 | 34 | 1 |
| 5 | 2 | 15 | 4 | 25 | 3 | 35 | 3 |
| 6 | 1 | 16 | 2 | 26 | 4 | 36 | 4 |
| 7 | 2 | 17 | 3 | 27 | 2 | 37 | 2 |
| 8 | 3 | 18 | 2 | 28 | 1 | 38 | 2 |
| 9 | 4 | 19 | 2 | 29 | 2 | 39 | 1 |
| 10 | 2 | 20 | 3 | 30 | 3 | 40 | 3 |

**II කොටස**

(1) i. (අ) ය, ර, ල, ව (ආ) ඟ, ඦ, ඬ, ඳ, ඹ
ii (අ) කන්කලු (ආ) කොලාහල
iii. (අ) දෙ + අත (ආ) පොත් + අල්මාරිය
iv. (අ) උපනායිකා (ආ) පිළිගනු
v. තෙපුල් - වචන
කෝ - කෝපය
vi. (අ) ශීඝ්‍රගාමී
(ආ) ලැව්ගින්න
vii. කැඩුවා (ආ) ලෙලිගහනවා
viii.(අ) නාවිකයන් වෙරළ කරා පැමිණ නැත
(ආ) මව හෝ පියා රැස්වීමට සහභාගී වන්නේය.
ix. (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා (ආ) මිශ්‍ර ක්‍රියා
x. (අ) ඔවුන් විසින් අපි කැඳවුණෙමු/කැඳවනු ලැබුවෙමු/කැඳවන ලදිමු
(ආ) පරිසර අමාත්‍යංශය විසින් වන ජීවීන්ගේ පැවැත්ම උදෙසා නව වැඩපිළිවෙළක් සකස් කෙරෙයි/ සකස් කරනු ලබයි/ සකස් කරනු ලැබෙයි

(02) රචනය
- ⋆ සාරවත් බව, මාතෘකාවද ඇතුළුව ලකුණු 08
- ⋆ සංවිධානය, නිර්මාණාත්මක බව හා ස්වීයත්වය ලකුණු 12
- ⋆ ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම ලකුණ 05

**(මුළු ලකුණු 25)**

(03) සාරාංශය : වචන සංඛ්‍යාව ලකුණු 02
අන්තර්ගතය ලකුණු 06
අකෘතිය, විරාම ලක්ෂණ,
පද බෙදීම, අක්ෂර වින්‍යාසය ලකුණු 02
ශිල්පීය දක්ෂතා

වර්තමානයේ නවකථාව අභියෝගයන් රැසකට මුහුණ දී ඇත. නවීන තාක්ෂණය හා උචිත අයුරින් වෙනස් විය යුතුය. නව විද්‍යුත් මාධ්‍ය කෙරෙහි ඇදෙන ජනතාව එයින් ගලවා ගෙන නවකථාව කෙරෙහි ඇද බැඳ තබා ගැනීමට නව ක්‍රම භාවිත කළ යුතුය.

**(මුළු ලකුණු 10)**

(04) i. සියබස්ලකර
ii. කව්සිළුමිණ
iii. මුවදෙව්දාවත
සසදාවත
කව්සිළුමිණ
iv. කාලයත් සමඟ කාව්‍යය ප්‍රවර්ධනය වී ගිය බව
v. ඡන්දස්
සංස්කෘත

(05) ලිපිය :- ආකෘතිය **ලකුණු 05**
අන්තර්ගතය **ලකුණු 07**
ශිල්පීය දක්ෂතා **ලකුණු 03**

## III කොටස

(01) i. (අ) පන්සිය පනස් ජාතක කතා පොත
(ආ) කුරුණෑගල
ii. (අ) මදසන් සුන් පියොවින් සිටි නොසැලී
(ආ) ගජසෙන් සිතියම් ගජ සිරි කියෙලී
iii. (අ) බැද්දේගම
(ආ) ඒ.පී. ගුණරත්න මහතා
iv. (අ) ජාතික තොටිල්ල හෙවත් දරු නැළවිල්ල
(ආ) ඔවා මුතු
v. (අ) අමාවතුර
(ආ) ගුරුළුගෝමී පඬිතුමා
vi. (අ) දඹදෙණි යුගය
(ආ) උග්ගසේන සිටු පුත්හුගේ වස්තුව
vii. (අ) සිංහල ෂෙලී
(ආ) කොළඹ යුගය
viii. (අ) සිංහල ජාතිය බිහිවීම පිළිබඳ කතා පුවත
(ආ) මහාවංශය
ix. (අ) කෝට්ටේ යුගය
(ආ) ගුත්තිල ජාතකය
x. (අ) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
(ආ) බුද්ධඝෝෂ හිමි

**(ලකුණු 2 x 10 = 20)**

(02) i. (අ) සසඟ - සම්බන්ධයක්
තුන්රුසක් වැ - පිරිස් තුනක්/ කණ්ඩායම් තුනක්
(ආ) ගුරුතුමාගේ බිරිඳ සමඟ සම්බන්ධයක් ඇතැයි කියා භේද කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කර පිරිස්/ කණ්ඩායම් තුනකට බෙදී ප්‍රථමයෙන් එක් පිරිසක් ගුරුතුමා ලඟට ගොස් නමස්කාර කර සිටියෝය.
ii. (අ) උග්ගසේන සිටුපුත්හු
(ආ) විද්වත් තම බිරිඳ නොගැළපෙන වචන කථා කරමින් දරුවා නළවන විට එම බැනීම් වළක්වා ගන්නා අදහසින් ප්‍රකාශ කළ අවස්ථාව
iii. (අ) කේවට්ට බමුණා බ්‍රහ්මදත්ත රජුට
(ආ) නුවර ඇතුළට ගෙන යන දර නැවැත්වීම
iv. (අ) කලදෝ දිය - රිදීපාට ජලය
රන් පුලින තලා - රත්තරං වැලි තලාව
(ආ) කඳු බෑවුම්වල ඇති පලතුරු වර්ගයක් වන දං හා දම් පාටින් හා සුදු පාටින් මල් පිපෙන කුඩා පඳුරු සහිත පැලෑටි විශේෂයත් පීරාගෙන පරවී වැටුණු මල් පෙති මග ඉතිරි නොකොට එම මල් පෙතිත් ගෙන රිදී පාට ජලය රත්තරං පාට වැලි තලාව තෙත් කරමින් ලස්සන මිහිරියාවක් සහිතව ගලාගෙන යාම
v. (අ) සිංහබාහු හා සිංහසීවලී
(ආ) සුප්පා දේවිය රජ කුමරියක් බව තම දරුවන්ට පැවසූ අවස්ථාවේ

**(ලකුණු 4 x 5 = 20)**

(03) i. ක්‍රියාශීලි ඇවතුම් පැවතුම් වලින් යුක්තවීම
- ඔහු වියපත් කල්හි දෙමව්පියෝ ශිල්ප උගන්නට තක්ෂලා නුවරට නගා යවූහ. හේ ධර්මාන්තේවාසිකව ශිල්ප උගන්නී
- වත් සපැන කී කී දැයක් වහා සපයයි, මන වඩන නියායෙන් හැරෙයි. පෙම් වඩන නියායෙන් බෙණෙයි.
- ආචාර්ය උනට දැහැව යටත්නි, මා පුතු මා කෙරෙහි නොබිඳැපියටියාවයි නෙරපීය.

ii. ගුරු වචයට ගරුකර ශිල්ප උපචාර දැක්වීම
- පුත, මිනිස් දහසක් මැරුව මැනව, එසේ වන්නා ශිල්පයට උපචාර කළාවේ යී කීයැ.
- හේ පඤ්චායුධ ගෙන ආචාර්යයා වැඳ අටවියට වැඳ වදනා තන්හිදු අටවිය මධ්‍යයහිදු, අටවියෙන් නික්මෙන තන්............ හිඳු සිටැ මිනිසුන් මරයි.

- මිනිසුන් මර මරා ඇඟිලි විදැ මාලා කොට දැරීය
- ශිල්පයට උපචාර කොටැ දැලි කප්වා නගා පිළි පෙරළා මව්පියන් දක්මියී අටවියට වදනා තැනට අවුදු මගින් පහව සිටියෙ

නැතහොත්

ගුත්තිල ඇදුරුතුමා ලත් විශිෂ්ට ජයග්‍රහණය
- ගුත්තිල මහ සිපී - සක්දෙව් බසින් සැතපී
- මින් දිනැමයි දැපී - බමර තත පළමුවෙන් සිඳපී
- දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
- පන්සිළු වීණ නද පසු බැස් වූ
- මනමත් කරවන දන මුළු දෙරණා

මූසිල අන්ද මන්දව සිටි ආකාරය
- තතු මතු ද සින්දේ - පිළිමල් දපද සින්දේ
- කෙළෙහි ගුණ සින්දේ - මූසිල අන්ද මන්දේ
- අනුවණ කම් කළේ - ගුරුන් ගුණ සිහි නොකළේ

(මෙම උදාහරණ හෝ මීට ගැළපෙන වෙනත් උදාහරණ සඳහා ලකුණු ලබාදෙන්න.

**(නිදසුන් සඳහා ල.4යි සමස්ථය පැහැදිලි කිරීමට ල.11 මුළු ලකුණු 15යි)**

(04) i. ජාතිකාභිමානය වඩවාලීම
- මුනි සිරිපා සිඹිමින්නේ
  සමනොළ ගිරි පෙදෙසින්නේ
- නිදහස මහ මුහුදක් වේ
  එහි උල්පත පුත නුඹ වේ
- ජාතික රණ දෙරණ මතේ
  ගැටී වැටී මළ මොහොතේ

ii. යුතුකම් හා වගකීම් අවධාරණය කිරීම
- තමන් ලැබූ දිවි පෙවෙතේ
  කොටසක් රට සමය වෙතේ
- ජාතිය රන් විමනක් වේ
  ආගම මිණි පහනක් වේ
- ඉටුකොට කළ යුතු යුතුකම්
  ලැබුණත් ලෝකෙන් ගැරහුම්
- කාටත් හිමි පොදු දේ නම්
  නැති - බැරි හිඟ අවහිරකම්

නැතහොත්

i. සරල බස් වහර
- කඳු බැවුමක දං බෝවිටි පඳුරු තලා
- රූපාකාර්ථ
- කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා

අනුප්‍රාස යෙදුම්
- "සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
  ඇඹරෙමි එහෙත් පසු නොබසිමි - නොනවතිමි"

ii. කෙතරම් බාධක පැමිණියත් පසුබට නොවී අරමුණ කරා ළඟා විය යුතු බව
- කවදා කොතැනකදී හෝ මහ මුහුද හිමි
  හමුවුණ කෙණෙහි මා සතු බර ඔහුට දෙමි
- එන්නේ කොයි සිටද? කොතැනකටද යන්නේ
  සමතැනැතලා හමුවෙයි අලසකම
- රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට

(මෙම උදාහරණ හෝ මීට ගැළපෙන වෙනත් උදාහරණ සඳහා ලකුණු දෙන්න.)

**(නිදසුන් සඳහා ල.4යි සමස්තය පැහැදිලි කිරීමට ල.11 මුළු ලකුණු 15යි)**

(5), (6), (7) ප්‍රශ්න සඳහා නිදසුන් තුනක් සහිතව නිවැරදිව ලියා ඇති පිළිතුරක් සඳහා ලකුණු 10ක් ලබාදෙන්න.

**(නිදසුන් තුනට ල.3යි සමස්තය පැහැදිලි කිරීමට ල.7 මුළු ලකුණු 10යි)**